# කැප්පෙටිපොළ පරපුරෙන් බිහි වූ කැප්පෙටිපොළ ශ්‍රී අභයරාජ විහාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**අබේරත්න ආර්.පී.ඒ.**[1]

කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාවනැල්ල රඹුක්කන ප්‍රධාන මාර්ගයේ, කැප්පෙටිපොළ හන්දියේ කැප්පෙටිපොළ ශ්‍රී අභයරාජ විහාරය පිහිටා ඇත. ඌව දිසාවේ තනතුර දැරූ මොණරවිල කැප්පෙටිපොළ දිසාවේගේ ජන්ම භූමිය වශයෙන් මෙය වැදගත්කමක් උසුලයි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ කැප්පෙටිපොළ ශ්‍රී අභයරාජ විහාරය කැප්පෙටිපොළ පරපුරේ උරුමයක් ද? යන්න සොයා බැලීම යි. සාහිත්‍ය ගවේෂණ, ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා මඟින් මූලික දත්ත රැස් කර ගන්නා ලදී. අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් කැප්පෙටිපොළ ශ්‍රී අභයරාජ විහාර පරිශ්‍රය හා ටැම්පිට විහාර පරිශ්‍රය තෝරා ගන්නා ලදී. කැප්පෙටිපොළ දිසාව 1818 උඩරට මහ කැරැල්ලේ දී සිංහලයන්ට නායකත්වය ලබා දුන් අතර එම නිසා කැරැල්ල පරාජය වූ පසු ඉංග්‍රීසීන් විසින් මරණයට පත් කරන ලදී. මොණරවිල කැප්පෙටිපොළ මහ දිසාවේගේ සොහොයුරා වූ මද්දුම බණ්ඩාර කැප්පෙටිපොළ වාසය කළේ මෙම ගමේ ය. ඔහු විවාහ වී සිටියේ මොල්ලිගොඩ හතර කෝරළයේ දිසාවගේ නැගණිය වූ අභයකොන් හේරත් වාසල මුදියන්සේ රාළහාමිල්ලාගේ ටිකිරි කුමාරි සමඟ යි. කැප්පෙටිපොළ නිලමේගේ අකල් මරණයෙන් පසු සොයුරා මද්දුම බණ්ඩාර නිලමේ ද අකල් මරණයට පත් විය. ඔවුන්ට දරුවන් නොසිටි නිසා හුදකලාවේ වාසය කළ ඔහු බිරිඳ ටිකිරි කුමාරි පසු ව කැප්පෙටිපොළ පරපුරට අයත් වලව්ව පන්සලක් කර ආසන්නයේ ටැම්පිට විහාරයක් ද ඉදිකර සඟ සතු කරන ලදී. වලව්වේ ඉඩම්වල රාජකාරී කළ පවුල් කිහිපයක් ද සමඟ එම ඉඩම් පූජා කර ඇති අතර වර්තමානයේත් විහාරයට අයත් එම ඉඩම් භුක්ති විඳිමින් රාජකාරිය එම පවුල්වල පිරිස සිදුකරයි. විහාර පූජාව 1855 දී වේකොළදෙණියේ ශ්‍රී සුමන ස්වාමීන් වහන්සේට සිකරන ලදී. මහනුවර යුගයෙන් පසුව ඉදි වූ ටැම්පිට විහාර අතරට කැප්පෙටිපොළ ශ්‍රී අභයරාජ විහාරයේ ටැම්පිට විහාරය එක්වෙයි. අඩි 7ක් උස ගල්ටැම් 21ක් මත මෙය ඉදිකර ඇත. කැප්පෙටිපොළ පරපුරේ උරුමයක් වන නිසාත්, ටැම්පිට විහාරය හා ඒ ආශ්‍රිත ගෘහ නිර්මාණ කලාව නිසාත්, ඉහළ පුරාවිද්‍යාත්මක අගයක් සහිත සිද්ධස්ථානයක් මෙන් ම විශාල ශාසනික සේවයක් කරන විහාරස්ථානයකි.

**ප්‍රමුඛ පද :** කැප්පෙටිපොළ පරපුර, කැප්පෙටිපොළ විහාරය, පුරාවිද්‍යාත්මක අගය

[1]ඉතිහාස අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. pramali.abeyrathna@gmail.com